# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/06 – 2023 ඔක්තෝබර් මස 30 වැනි සඳුදා – 2023.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/240.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

එච්.පී.එම්.එස්.එච්.කේ.පොඩිනිලමේ මයා, "සිසිර" ,වලස්වැව,නෑගම්පහ.

*සහ*

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, "සව්සිරිපාය", අංක 123, විජේරාම මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,ගැටහැත්ත, රාජ්‍ය සේවක ගම්මානය, බී 27හි පී.එච්. ආනන්ද මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දීය.

---

මගේ අංකය: IR/COM/04/2018/240.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්.පී.එම්.එස්.එච්.කේ.පොඩිනිලමේ මයා, "සිසිර'', වලස්වැව,නෑගම්පහ.

*සහ*

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, "සව්සිරිපාය'', අංක 123, විජේරාම මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ

'' ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සේවය කළ එච්.පී.එම්.එස්.එච්.කේ.පොඩිනිලමේ මහතාට එම ආයතනයේ සේවය කළ කාලය තුළදී අභ්‍යන්තර උසස්වීම් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කුමක් ද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදි.

EOG 10 - 0298

---

මගේ අංකය: IR/COM/02/2022/142.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

එස්.පුෂ්පරාණි මිය, අංක. 524/4, සාන්ත වින්සෙන්ති නිවස, දියලගොඩ පාර, මග්ගොන.

*සහ*

ඩී.පී.ජී. සුභාෂ් චමින්ද ප්‍රනාන්දු පියතුමා, සාන්ත වින්සෙන්ති නිවස, දියලගොඩ පාර, මග්ගොන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නක්කාවත්ත, බිහල්පොල,මුතුගල පාර, නීතීඥ රණසිංහ ආරච්චිලාගේ තිලකරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/02/2022/142.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එස්.පුෂ්පරාණි මිය, අංක. 524/4, සාන්ත වින්සෙන්ති නිවස, දියලගොඩ පාර, මග්ගොන.

*සහ*

ඩී.පී.ජී. සුභාෂ් චමින්ද ප්‍රනාන්දු පියතුමා, සාන්ත වින්සෙන්ති නිවස, දියලගොඩ පාර, මග්ගොන.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ

'' සාන්ත වින්සෙන්ති නිවසෙහි සේවය කළ එස්.පුෂ්පරාණි මහත්මියගේ සේවය අත්හිටු වූ බවට ඇය විසින් කරනු ලබන ප්‍රකාශය අනුව, ඇයගේ රැකියාව අහිමි වී පවතී ද අහිමි වී ඇත්නම් ඇයට යම් සහනයක් හිමිවේ ද එසේ සහනයක් හිමිවිය යුතු නම්, හිමිවිය යුතු සහන මොනවද යන්න පිළිබඳව වේ.''

**බී. කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදි.

EOG 10 - 0299

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.